**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය - 2023**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිත භාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7හි 52 හා 53 ඡේදවලට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රත්‍යාගණන සංචිත ගිණුමෙන් රු.6,303,511ක් විලම්භිත ආදායම් ලෙස මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශයට බැර කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සේවයෙන් ඉවත් වූ නිලධාරීන් 04 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.474,794 ක් පාරිතෝෂික ලෙස වෙන් කර තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයේ ඌනතාවය සහ පාරිතෝෂික වෙන් කිරීම් වැඩියෙන් දක්වා තිබුණි. | විගණනය සඳහන් කර ඇති ගෙවීම් 2024 වර්ෂය වනවිට නිශ්චිතව වූ බැවින් කෙටිකාලීන වෙන්කිරීම් ලෙස දක්වා ඇති බව. | පාරිතෝෂික වෙන් කිරීමේදී සේවයෙන් ඉවත් වූ නිලධාරීන් පිළිබඳව අවධානය යොමු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයතුලදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික (ICT) නියෝජිත ආයතනයෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.2,261,416 ක් වටිනා උපකරණ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ පරිත්‍යාග ලැබීම් ලෙස මුළු වටිනාකම් ගිණුම්ගත කළ යුතු වුවද ඉන් රු.130,108ක් විලම්භිත ආදායම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට හා රු.2,131,307ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙසත් ගිණුම්ගත කර තිබුණි. | මෙය හිමිකම් ප්‍රකාශයට නොව ශේෂ පත්‍රයට සිදුකරනු ලබන ගැලපීමකි. මෙම වත්කම් සඳහා ක්ෂය ගණනය කර හිමිකම් ප්‍රකාශයට නිවැරදිව ගැලපීම් සිදුකර ඇති බව. | පරිත්‍යාග ලෙස ලද උපකරණ මුළු වටිනාකම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ පරිත්‍යාග ලැබීම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.3,909,000 ක් (බ්‍රිතාන්‍ය පවුම් 10,000 ) වටිනාකමැති ළමා අපයෝජන වාර්තා කිරීම සඳහා වන අන්තර්ජාල ද්වාර මෘදුකාංගය සහ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් සංවර්ධනය කර ලබා දී තිබුණු රු.1,461,961 ක් වූ දත්ත පද්ධතිය ගිණුම්ගත කර නොතිබුණි. | ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පරිත්‍යාග කර ඇති අන්තර්ජාල ද්වාර මෘදුකාංගය සම්බන්ධව පරීක්ෂා කර බලා ඉදිරියේදී අවශ්‍ය ගැළපීම් වේ නම් නිවැරදි කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලද බව. | මෘදුකාංගයේ හා දත්ත පද්ධතියේ වටිනාකම ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ විලම්භිත ආදායම රු.14,115,850 ක් වුවද එය රු.10,260,674 ක් ලෙස හා පෙර වර්ෂයේ ලද රු.3,253,206ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වර්ෂයේ ඌනතාවයට ගැලපීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.601,969ක් වැඩියෙන් දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගලපන ලද ස්ථානය වෙනස් වුවද ශුද්ධ මුදල් ප්‍රවාහයට බලපෑමක් නොවන බව. | ප්‍රමිතය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |
| (ඉ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී සමාලෝචිත වර්ෂයේ ලද ද්‍රව්‍යමය ව්‍යාපෘති ආධාර රු.3,378,000 ක් මුදල් ගලා ඒමක් ලෙස හඳුනාගෙන තිබීමෙන් හා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබී තිබූ රු.697,756 ක් මුදල් ගලා ඒමක් ලෙස දැක්වීම වෙනුවට රු.3,440,856 ක් මුදල් ගලා යාමක් ලෙස හඳුනා ගැනීම හේතුවෙන්, රු.760,612 කින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රමාණය වැඩියෙන් දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගැලපීම් සම්බන්ධයෙන් තව දුරටත් පරීක්ෂා කර බලා ඉදිරියේදී නිවැරදි කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලද බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී මුදල් ගලායාම් හා ගලා ඒම් නිවැරදිව හඳුනා ගත යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විවිධ වැඩසටහන් ක්‍රියාවට නැංවීම | 2,568,680 | පාසල් ලිපිද්‍රව්‍ය, ආධාර භාරදුන් බවට හා අදාල ප්‍රතිලාභියා විසින් ආධාර භාරගත් බවට වූ ලේඛන | 2024 වර්ෂයේ දී මෙම අඩුපාඩුව මගහරවා ගැනීමට කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කොට ඇති බව. | ආධාර භාරදුන් බවට හා අදාල ප්‍රතිලාභියා විසින් ආධාර භාරගත් බවට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත<br><br>(i)14 (ඊ) වගන්තිය | ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා 2019 ඔක්තෝබර් 29 දින අනුමැතිය ලැබී තිබුණද මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාල පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසන් දිනය දක්වාම අපොහොසත්වී තිබුණි. ඒ හේතුවෙන් අදාල ජාතික මෙහෙයුම් කමිටුව, පළාත් කමිටු, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය කමිටු ස්වාධීන තාක්ෂණික කව ලෙස ස්ථාපනය සහ පැවැත්වීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ කෙටුම්පත සඳහා අවස්ථා කිහිපයකදී රේඛීය අමාත්‍යාංශය විසින් සංශෝධනයන් ඉදිරිපත් කර ඇති අතර අනුමැතින් ලබා ගැනීම සඳහා කාලයක් ගත වී ඇති බව. | ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාල පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| | (ii)14(ඌ) වගන්තිය | සමාලෝචිත වර්ෂය තුලදී ළමා අපයෝජන නඩු කටයුතු පිළිබඳ නීති අංශය විසින් කැඳවන ලද තොරතුරු පොලිස් ස්ථාන 96කින් ලැබී නොතිබුණි. තවද ළමා අපචාර සම්බන්ධ නඩු කටයුතු නියාමනය කිරීමේ කටයුතු සිදු කිරීමට අධිකාරියේ නීති අංශය අපොහොසත්වී තිබුණි. | පොලිසිය හරහා රැස් කරන ලද නඩු තොරතුරු පොලිස් නිලධාරින්ගේ සහායෙන් යාවත්කාලීන කිරීමට ක්‍රමවේදයක් පිළියෙල කර ඇතත් ප්‍රමාණවත් දැනුමක් ඇති කාර්ය මණ්ඩලයක් අධිකාරියේ නීති අංශයේ නොමැතිවීම හේතුවෙන් මෙම නඩු තොරතුරු සියල්ල විධිමත්ව යාවත්කාලීන කිරීමක් 2023 දී සිදු නොවූ බව. | පනත ප්‍රකාරව නඩු කටයුතු නියාමනය කිරීම සිදු කළ යුතුය. |
| | (iii)14 (ඉ), (ඕ), (උ) වගන්ති | 2011 වර්ෂයේ සිට මෙම වාර්තාවේ දිනය දක්වා අධිකාරියට ළමා අපචාර සම්බන්ධයෙන් පැමිණිළි 123,732 ක් ලැබී තිබූ අතර, ඉන් පැමිණිළි 52,922 ක් එනම් සියයට 43 ක් තවදුරටත් විමර්ශනය වෙමින් පැවතුණි. එබැවින් ළමා අපචාර වලට ගොදුරු වූ ළමුන් සම්බන්ධ පැමිණිළි විමර්ශනය කිරීමේ ක්‍රියාවලිය ළමයා වැඩිහිටියෙක් බවට පත්වීමට ප්‍රථම | 2011 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ලද පැමිණිලි සියල්ල සඳහා අවශ්‍ය මූලික මැදිහත්කරණය ලබා දී ඇති අතර 2011 වර්ෂයට අදාල සියළු පැමිණිලි අවසන් කර දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සිදු | විමර්ශනය වෙමින් පවතින පැමිණිලි වල විමර්ශන කටයුතු අවසන් කිරීමට කඩිනමින් ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අවසන් කිරීම සඳහා වූ ක්‍රමවේදයක් සැකසීමට අධිකාරිය සතු වගවීම ඉටුකිරීමට අධිකාරිය අපොහොසත්ව තිබුණි.<br>ළමා අපචාර සම්බන්ධයෙන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය නිලධාරීන්ගේ විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතීමත් රට තුළ දිනෙන් දින වර්ධනය වන ළමා අපචාර වැළැක්වීම සම්බන්ධයෙන් අධිකාරියෙහි නිසි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවීමත් තවදුරටත් නොවිසිඳුණු පැමිණිළි විශාල ලෙස වර්ධනය වීමට හේතු වී තිබුණි. | කර ඇත. 2012 වසරේ සිට සමස්ත පැමිණිලි ප්‍රමාණය තවදුරටත් විමර්ශනය වෙමින් පවතින බව. | |
| (iv)14(ක) වගන්තිය | දත්ත පද්ධතිය ස්ථාපනය කර ළමා අපචාර සම්බන්ධයෙන් කටයුතු කරන ශ්‍රී ලංකා පොලිසිය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සහ රේඛීය අමාත්‍යාංශය අතර විධිමත් සම්බන්ධීකරණයක් ඇති කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීමට මේ දක්වා කටයුතු නොකිරීම හේතුවෙන් දිවයිනෙන් ලැබෙන ළමා අපචාර සම්බන්ධ පැමිණිළි කොපමණද යන්න හා එම පැමිණිලිවල වර්තමාන ප්‍රගතිය සම්බන්ධව සොයා බලා තහවුරු කිරීමට අධිකාරියට නොහැකි තත්වයක් පවතින බව විගණනයේදී අනාවරණය විය. | දැනට පවත්වා ගෙන යනු ලබන දත්ත පද්ධතිය ජාතික දත්ත පද්ධතියක් දක්වා වැඩි දියුණු කිරීමට කටයුතු කරමින් පවතින අතර දත්ත පද්ධතිය සකස් කිරීම සඳහා ගිවිසුම් ගත වීම සම්බන්ධව නිරීක්ෂණ ඔවුන් වෙත යොමු කර ඇති බවත් සංවර්ධන කළ යුතු කාර්යයන් සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම ගැටළුකාරී වී ඇති බව. | ළමා අපචාර සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන අතර විධිමත් සම්බන්ධීකරණය ක් ඇතිවන යාන්ත්‍රණයක් ලෙස දත්ත පද්ධතියක් ස්ථාපනය කළ යුතුය. |
| (v)14(ඒ) වගන්තිය | ● පළාත් මට්ටමින් වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක ආරම්භ කිරීම සඳහා 2021 වර්ෂයේදී කැබිනට් අනුමැතිය ලබා දී තිබුණද මෙම වාර්තාවේ දිනය දක්වාම පළාත් 7ක එම ඒකක පිහිටුවීමට කටයතු කර නොතිබුණි. 2013 වර්ෂයේ ආරම්භ කරන ලද දකුණු පළාතේ වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකයෙහි පැවති අඩුපාඩු හේතුවෙන් 2015 වර්ෂයේ සිටම මෙම ඒකකය සහ ලද තාක්ෂණික උපකරණ නිෂ්කාර්යව පැවතුණි. නැවත එම තාක්ෂණික උපකරණ ප්‍රතිස්ථාපනය කිරීමට රු.7,760,500ක් වැය වන බවට ඇස්තමේන්තුකර තිබුණි. | දකුණු පළාත් විඩියෝ සාක්ෂි පටිගත කිරිමේ ඒකකවල රෙකෝඩර් යන්ත්‍ර නොමැතිකම හා තවත් තාක්ෂණික සංවර්ධනය කිරීම් රැසක් කල යුතුව ඇති බැවින් එහි පටිගත කිරීම් සිදු කල නොහැකි තත්වයක් මතු වී ඇති බව. කරාපිටිය පිහිටි ඒකකය සඳහා නිලධාරින් 2022 පෙබරවාරි මස බඳවා ගෙන ඇතත් ඒකකය ආරම්භ නොමැති | පනතේ විධිවිධාන පරිදි වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවා සාක්ෂි පටිගත කිරීම සිදු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ● නීතිපති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ මාර්ගෝපදේශයේ 2.5 වගන්තිය ප්‍රකාරව වින්දිත ළමයින්ට නවාතැන් පහසුකම් ලබා ගැනීම සඳහා ආරක්ෂිත නිවාසයක් (safe house) වාර්තාවේ දිනය දක්වාම අධිකාරිය විසින් පවත්වාගෙන යාමට අපොහොසත්වී තිබුණි. | බැවින් ඔවුන් මේ වන විට ප්‍රධාන කාර්යාලයේ පිහිටි ඒකකයේ සේවයට යොදවා ඇති බව | |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි අංක 371(5) | සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 67 කදී ලබා දුන් එකතුව රු.1,558,700ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම පියවා නොතිබුණි. | නැවත මෙවැනි ගැටලු ඇති නොවීමට උපදෙස් ලබාදෙන ලද බව. | චක්‍රලේඛ ප්‍රකාරව අත්තිකාරම් පියවීම් සිදු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.11,341,231 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.10,255,583 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,085,648 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට උපයෝගීතා වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්මට අදාලව පවත්වන ලද වැඩසටහන් වල සම්පත් දායකයින් ලෙස අධිකාරියේ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන්, සිය රාජකාරී කාලය ඇතුළත සහභාගී කරවාගෙන අධිකාරී බලයකින් තොරව ඔවුන් වෙත රු.442,800 ක් දීමනා ගෙවා තිබුණි. | 2016.10.27 දින මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති DMS/1760/Vol-1 චක්‍රලේඛය අනුව ගෙවීම් සිදු කර ඇති අතර අනුමත සංකල්ප පත්‍රිකාව ප්‍රකාරව සියළුම කාර්යයන් සිදු කර ඇති බව. | අධිකාරියේ අභ්‍යන්තර නිලධාරීන් සඳහා දීමනා ගෙවීම් වෙනුවෙන් නිසිපරිදි අනුමැතිය ලබා ගත යුතුය. |
| තවද වැඩසටහන් සඳහා සහභාගී වන රජයේ නිලධාරීන් සඳහා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සහභාගීත්ව දීමනා ලෙස රු.500 බැගින් ගෙවා තිබුණි. | එක් දින පුහුණු වැඩසටහනක් සඳහා සහභාගි වූ නිලධාරීන්ගේ ප්‍රවාහන ගාස්තු ලෙස පැමිණීමේ දීමනාවක් ලබාදෙන ලද බව. | |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ සිට ජාතික ළමා ආරක්ෂක අධිකාරියට භාවිතයට ගන්නා ලෙස වාචිකව පවරන ලද මුලතිවු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ගොඩනැගිල්ල වාර්තාවේ දිනය දක්වාම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. එහෙත් මෙම ගොඩනැගිල්ලේ ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.1,084,684 ක් වැය කර තිබුණි. | මෙම ගොඩනැගිල්ල ඵලදායීව යොදා ගැනීම සඳහා සුදුසු ආයතනයකට පවරා දීමට දැනුම් දී ඇති බව. | මෙම ගොඩනැගිල්ල ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජාතික ළමා ආරක්ෂක අධිකාරියට යාබද ඉඩම රු.18,317,757 ක වටිනාකමකට 2016 වර්ෂයේදී වර්ෂ 30ක කල් බදු පදනම යටතේ ලබාගෙන තිබුණද එම ඉඩම වාර්තාවේ දිනය දක්වාම කිසිදු කාර්යයකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | මෙම ඉඩමෙහි යෝජිත ඉදිකිරීම් සඳහා මුදල් අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන දිගින් දිගටම ඉල්ලුම් කළ ද ඒ සම්බන්ධ ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කර නොමැති බැවින් ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇති බව. | නිෂ්කාර්යව පවතින ඉඩම භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 වෙනත් සංවිධානවලට මුදාහැරී සම්පත්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ සහකාර කළමණාකරු (වැඩසටහන්) වසර 12 කට අධික කාලයක සිට බාහිර ආයතන සඳහා මුදා හැර තිබීම හේතුවෙන් මෙම තනතුර මඟින් ඉටු විය යුතු කාර්යයන් කාර්යක්ෂම අයුරින් ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | මෙම නිලධාරිණිය මුදල් රාජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් තනතුරට පත් කිරීම සඳහා සේවයෙන් නිදහස් කර වීමට කටයුතු කරන ලෙස දැනුම් දී තිබුණු බව | අනුමත කාර්ය මණ්ඩලය තුළ සිටින නිලධාරීන් දීර්ඝ කාලීනව වෙනත් ආයතනවලට මුදා හැරීමේදී අධිකාරියේ කාර්ය සාධනයට වන බලපෑම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 ජනවාරි 25 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියට පටහැනිව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විමර්ශන නිලධාරී, කළමනාකරු (සැලසුම් හා තොරතුරු),තොරතුරු හා තාක්ෂණික | මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි ත්‍රිපුද්ගල කමිටුවක් පත් කොට ඇති අතර, කමිටුව විසින් අදාල පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. අදාල වාර්තාව ලද පසු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියට අනුකූලව සියළු බඳවා ගැනීම් සිදුකළ යුතුය. |

| | |
|---|---|
| සහායක තනතුර, කළමනාකරු වැඩසටහන්, සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය හා තොරතුරු) යන තනතුරු සඳහා අවම මූලික සුදුසුකම් නොමැති නිලධාරීන් බඳවා ගැනීම සිදු කර තිබුණි. | කොට ඉදිරි පියවර ගැනීමට නියමිත බව. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම ආරම්භ කර තිබුණද කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද අධිකාරිය අපොහොසත්වී තිබුණි. | නීතිපති දෙපාර්තමේන්තුව හරහා පිළිතුරු ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා සංදේශය යොමු කිරීම 2023 වර්ෂයේදී සිදු කිරීමට නොහැකි වූ බව. | ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා කඩිනමින් පියවර ගත යුතුය. |